වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ඇල්කඩුව වැවිලි සමාගම

# ඇබෑර්තු

ඇල්කඩුව වැවිලි සමාගමේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර : මූල්‍ය කළමනාකරු - 01 (ස්ථිර)

*** සුදුසුකම් - බාහිර අයදුම්කරුවන්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය, මූල්‍ය හෝ වාණිජ විෂය ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබිය යුතුය.

**හෝ**

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ (ICASL) අතරමැදි මට්ටමේ සුදුසුකම් ලබා තිබිය යුතුය.

**හෝ**

- වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) අතරමැදි මට්ටමේ සුදුසුකම් ලබා තිබිය යුතුය.

**හෝ**

- වරලත් සහ සහතිකලත් ගණකාධිකාරී සංගමයේ (ACCA) අතරමැදි මට්ටමේ සුදුසුකම් ලබා තිබිය යුතුය.

**සහ**

- ප්‍රාදේශීය වැවිලි සමාගමක, රාජ්‍ය දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය.

*** සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන්**

- කනිෂ්ඨ කළමනාකරණ ශ්‍රේණි I හි මූල්‍ය නිලධාරි හෝ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරක අවම වශයෙන් වසර 05ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය** : MM 1-1 - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : No. 01/2025

වැටුප රු. 91,690- 2480X10-3450X15-Rs.168, 240/-

**මූලික වැටුප් පියවර** : 01.01.2026 රු.81, 710.00 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II අනුව)

**වයස** : වයස අවුරුදු 25ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රම වේදය** - පත්කිරීමේ බලධාරීන් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කෙරේ.

**ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය**

| | |
|---|---|
| ● අදාළ අමතර පළපුරුද්ද | ලකුණු 30 |
| ● අදාළ අමතර සුදුසුකම් | ලකුණු 30 |
| ● වෙනත් ලද ජයග්‍රහණ | ලකුණු 15 |
| ● සම්මුඛ පරීක්ෂණයේ දී ලබන කාර්ය සාධනය | ලකුණු 25 |
| | **ලකුණු 100** |

**වෙනත්**

I. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරේ රාජකාරි කාර්යක්ෂමව ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ශාරීරික හා මානසික වශයෙන් සුදුසු විය යුතුය.

III. විශිෂ්ට චරිතයක් සහිත අයෙකු විය යුතුය.

**සටහන** - දෙමළ භාෂාව භාවිත කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**අයදුම්පත්** - අයදුම්කරුවන් විසින්,සියලුම විස්තර හා උප්පැන්න, අධ්‍යාපනික සහතික වල හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සහිතව සකස් කළ අයදුම්පත්, පහත සඳහන් ලිපිනය වෙත, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අදාළ භාරගැනීම අවසන් කරනු ලබන වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය අගෝස්තු මස 06 වන දිනට පෙර පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය.

**සභාපති,**
**ඇල්කඩුව වැවිලි සමාගම, රත්වත්ත, උකුවෙල .**
**066-2242518**
**20/07/2026**